# ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුර සඳහා බඳවා ගැනීම - 2018

ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක(කෘෂි ව්‍යාප්ති) තනතුරේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට ඌව පළාත තුළ ස්ථිර පදිංචි පහත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2019.02.22 වන දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුර | - | තාක්ෂණ සහායක(කෘෂි ව්‍යාප්ති) |
| බඳවා ගන්නා ශ්‍රේණිය | - | III ශ්‍රේණිය |

**02. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

(අ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාවන් බලනොපානු ඇත.

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) ඌව පළාතේ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. ඡන්ද හිමි නාම ලේඛනයෙන් පදිංචිය සනාථ කල යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි විධි විධාන ප්‍රකාරව වසර 05ක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සේවය කරන ලෙසට නියම කෙරෙන ඌව පළාතේ කවර හෝ ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඈ) තෝරා ගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයට හා මුදල් රීති සංග්‍රහයටද, මුදල් රෙගුලාසිවලටද, රජයේ සහ පළාත් සභා රාජ්‍ය සේවයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් විය යුතුය.

**04. වැටුප් පරිමාණය :-**

රා.ප.ච. 03/ 2016 හි වැටුප් පරිමාණය - MT 1 – 2016 අනුව රු. 29,840/- – 10 x 300 – 11 x 350 – 10 x 560 - 10 x 660– රු. 48,890/-

* රා.ප.ච. 03/2016 හි උපලේඛණ II අනුව වැටුප් ගෙවනු ලැබේ.

**05. බඳවා ගැනීමේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :**

**(I)** අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත් වී තිබීම

හා

රජයේ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් වල පස් වන(V) මට්ටමේ පාඨමාලා සහතිකය(NVQ)ලබා තිබීම.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ඒ හා සමාන යැයි පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :-**

1. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති විට ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇත්නම් තරග විභාගයක් නොපවත්වන අතර, සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
2. තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.
3. තරග විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ. තරග විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.
4. තරග විභාගයේ විෂය නිර්දේශය 10 ඡේදයේ දක්වා ඇත. විභාගයෙන් සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව 40% කි.
5. විභාග දිනයේදි අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

**07. අයදුම් කළ යුතු පිළිවෙල :-**

1. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවටද අංක 05 සිට ඉදිරියට වන කොටස් දෙවන හා තෙවන පිටුවලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය සැකසිය යුතු අතර, අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2019.02.22 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ඔබ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.
3. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
4. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, ප්‍රමාද වී ලැබෙන, අඩුපාඩු සහිත හා අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍ර තැපෑලේදි නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයොජනවත් වනු ඇත.

**08. අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**09. විභාග හා පරිපාලන වියදම් :-**

විභාග ගාස්තු හා පරිපාලන ගාස්තු රු.600/- කි. අදාළ විභාග ගාස්තු ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය.

ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**10. තරග විභාගය හා ඊට අදාළ විෂය නිර්දේශ සම්බන්ධ තොරතුරු:-**

තරග විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය - කාලය - පැය 01 ලකුණු -100

   මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවත්, සිතීමේ තර්කානුකූලත්වය,සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් හා තීරණ ගැනීමේ ශක්තිය,විනිශ්වය කිරීම සඳහා සකස් වූ වාස්තවික ව්‍යුහගත ප්‍රශ්න වලින් යුක්තය.

2. පොදු පරීක්ෂණය(තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය) - කාලය - පැය 01 ලකුණු - 100

   1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය
      - 1.1. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
      - 1.2. රැකියා වියුක්තිය
      - 1.3. කෘෂිකර්මාන්තයේ අපනයන හා ආනයන තත්ත්වය

   2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

   3. පස හා ශාක පෝෂණය
      - 3.1. පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම
      - 3.2. ශාක පෝෂණය පාංශු / ශාක පෝෂණය කළමනාකරණය
      - 3.3. පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

   4. වී නිෂ්පාදනය
      - 4.1. පාංශු දේශගුණික අවශ්‍යතාවය
      - 4.2. ප්‍රභේද
      - 4.3. බිම සකස් කිරීම හා තවාන් පාලනය
      - 4.4. පළිබෝධ හා රෝග මර්ධනය
      - 4.5. පොහොර යෙදීම
      - 4.6. ජල කළමනාකරණය / අස්වනු වැඩි කර ගැනීමේ නූතන ක්‍රමවේදය
      - 4.7. අස්වනු නෙළීම හා පසු අස්වනු තාක්ෂණය

   5. වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය
      - 5.1. ලොකු ළූණු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු සහ වෙනත් බෝග වල ප්‍රභේද

   6. එළවළු නිෂ්පාදනය
      - 6.1. එළවළු තවාන් පාලනය
        - 6.1.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු අස්වනු නෙළීම හැ සැකසීම

   7. පළතුරු
      - 7.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු
      - 7.2. අස්වනු නෙළීම හා සැකසීම

   8. භෝග ආරක්ෂණය
      - 8.1. භෝග වගාවට වැළඳෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම ඒවායේ පාලන විධි

8.2. වල් මර්දනය, වල් මර්දන ක්‍රම
8.3. පළිබෝධ නාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම වේද

9. ජල වහනය හා එහි වැදගත්කම

10. පාංශු රසායනය
    10.1. පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

11. වාරිමාර්ග හා ජල කළමනාකරණය
    11.1. විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
    11.2. ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම

12. ගොවිපල් යාන්ත්‍රීකරණය
    12.1. ගොවිපල් යාන්ත්‍රීකරණයේ වාසි අවාසි
    12.2. බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
    12.3. ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
    12.4. ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව

13. මී මැසි පාලනය
    13.1. ආර්ථික වැදගත්කම
    13.2. මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වා ගෙන යාම
    13.3. අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළට සකස් කිරීම

14. මල් වගාව හා භූමි අලංකරණය
    14.1. ආර්ථික වැදගත්කම
    14.2. භූමි අලංකරණය ක්‍රම
    14.3. වෙළඳ පොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳ පොළට සකස් කිරීම

15. ආරක්ෂිත භෝග වගාව
    15.1. වැදගත්කම
    15.2. සැලසුම් කිරීම
    15.3. භෝග තෝරා ගැනීම
    15.4. පවත්වා ගෙන යාම හා අස්වනු සකස් කිරීම

16. සත්ව පාලන
    16.1. කුකුල් පාලනය හා කිරි ගව නිෂ්පාදනය
    16.2. සමෝදාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් සත්ව නිෂ්පාදන පවත්වා ගැනීම

17. කෘෂිකාර්මික ව්‍යාප්තිය
    17.1. කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදය
    17.2. කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

18. පටක රෝපණය
    18.1. පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම
    18.2. පටක රෝපණයේ භාවිතයන් / යෙදීම්, උදාහරණ
    18.3. පටක රෝපණයේ වාසි අවාසි

19. පැළෑටි නිරෝධානය පිළිබඳ දැනුම
    19.1. පැළෑටි නිරෝධාන රෙගුලාසි පිළිබඳ දැනුම
    19.2. පැළෑටි නිරෝධානය ක්‍රම

20. ශාක සංරක්ෂණය
    20.1. ශාක සංරක්ෂණයේ වැදගත්කම ( ශාක / ජාන ප්ලාස්ම )
    20.2. ශාක සංරක්ෂණ ක්‍රම ( ශාක / ජාන ප්ලාස්ම )

21. ජෛව තාක්ෂණය
    21.1. DNA වල වැදගත්කම
    21.2. ජානය යනු කවරක්ද, එහි ක්‍රියාකාරිත්වය
    21.3. ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව

22. කෘෂිකර්ම සංවර්ධනය

වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒකක හා ඒවායේ කාර්යභාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාර වන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් වල යහපත් හා අයහපත් බලපෑම්

සටහන :

විභාගය සමත් වීම සඳහා එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් වත් ලබා ගත යුතුය. ලබාගත් ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

**11. සාවද්‍ය තොරතුරු සැපයිම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ඇත.

12. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම /නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම් / තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

ගාමිණී මහින්දපාල ජෝපියස්
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2019.01.25 වන දින.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
බදුල්ල.